**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව- 2023**

**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 අප්‍රේල් 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) අනුව තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් 2023 මැයි 03 නිලධාරින් තිදෙනකු වෙත නිකුත් කරන ලද අත්තිකාරම් මුදලින් රු.1,049,227 ක් එසේ පියවා නොතිබුණි. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, ප්‍රාග්ධන වැය විෂයන් 03ක ප්‍රතිපාදිත මුදලින් සියයට 55ක සිට සියයට 95ක් දක්වා පරාසයකින් එකතුව රු.5,497,128ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | රාජ්‍ය වියදම් කළමණාකරණය යටතේ අත්‍යාවශ්‍යම සේවාවන් සඳහා පමණක් වියදම් කිරීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය නොවීම් සිදුවී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතුය. |

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 257 | සහතික කළ වවුචර සඳහා පමණක් ගෙවීම් කළ යුතු වුවත් නිලධාරින් දෙදෙනකු සඳහා සංයුක්ත දීමනා හා අනියම් දීමනා ලෙස එකතුව රු.922,810ක් එසේ සහතික කිරීමකින් තොරව වවුචර් දෙකකින් ගෙවා තිබුණි. | වවුචර්පත් දෙකක් සහතික කිරීම මගහැරී ඇති නමුත් විදේශ විනිමය නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ වවුචරයට අදාළව බැංකුවට ඉදිරිපත් කරනු ලැබූ ලිපියේ ගණකාධිකාරිගේ අත්සන ඇතුළත් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික කළ වවුචර්වලට පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 880 | ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරින් ඇප තබා නොතිබුණි. | අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය මඟින් ඉදිරියේදී සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාර්යන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකාව, තහනම් කළ සහ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාර මඟින් හා ප්‍රපාතනයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණින් 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු | වාණිජ දෙපාර්තමේන්තුව ඇවර කිරීම පිළිබඳව 2023 නොවැම්බර් 22 දින නඩුවක් පවරා ඇති බැවින් හා ඒ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම | පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියමයන් කඩිනමින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පනත හඳුන්වා දී තිබුණි. පනත හඳුන්වා දී වර්ෂ 05 ක් ගතවී ඇතත් මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියමයන් ගැසට් නොකිරීම හේතුවෙන් පනත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපිය මඟින් වාණිජ දෙපාර්තමේන්තුව ඇවර කිරීමට අදාළ කටයුතු කිසිවක් 2024 මැයි 08 තෙක් සිදු නොකරන ලෙස දන්වා ඇත. | |
| (ආ) | “වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සමාලෝචනය කිරීම“ යන මැයෙන් වූ 2023 ජූනි 26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සමඟ ඉදිරිපත් කරන ලද නිලධාරි කමිටු වාර්තාවේ 4 වන ඡේදයේ සඳහන් නිර්දේශ 06 ක්‍රියාත්මක කිරීමට 2023 ජූලි 24 දිනැති අංක අමප/23/1216/627/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණි. දෙපාර්තමේන්තුවේ සේවයකරන අධ්‍යක්ෂවරු හා වාණිජ නිලධාරින් අනුයුක්ත කිරීම් සිදුකල යුතු ආකාරය පිළිබඳව වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ ලබා දී මාස දෙකක කාලයක් ඇතුළත එම නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබුණද ලබාදුන් කාලය තුළදී එම කාර්යය ඉටු කර නොතිබුණි. | වාණිජ දෙපාර්තමේන්තුව ඇවර කිරීම පිළිබඳව 2023 නොවැම්බර් 22 දින නඩුවක් පවරා ඇති බැවින් හා ඒ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපිය මඟින් වාණිජ දෙපාර්තමේන්තුව ඇවර කිරීමට අදාළ කටයුතු කිසිවක් 2024 මැයි 08 තෙක් සිදු නොකරන ලෙස දන්වා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ පළමු, දෙවන හා බිම් මහලේ විදුලි ගාස්තු පිළිවෙලින් රු.537,705 රු.663,117 හා රු.4,158,572 ක්ද සමාලෝචිත වර්ෂයේ එම මහල්වල විදුලි ගාස්තු රු.1,382,078 රු.1,386,206 හා රු.11,035,179ක් වූයෙන් බිම්මහලේ විදුලි ගාස්තු අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. | M මහලෙහි බිල්පත ද බිම් මහලේ විදුලි බිල්පතට ඇතුළත් කර තිබීම හා දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය ස්ථාපිත සියලුම මහල්වල වායු සමීකරණ යන්ත්‍රවලට අදාළ Cooling Tower හි විදුලි පරිභෝජන වියදමද බිම් මහලට එකතු කර තිබීම බිල්පත ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත. | වියදම් පාලනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාණිජ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ බිම් මහලේ කොටසක සතොස ආයතනය මඟින් අලෙවි සැලක් පවත්වාගෙන යනු ලබන අතර තක්සේරු කරන ලද | අයවිය යුතු හිඟ මුදල් අයකරගැනීම සඳහා අඛණ්ඩව ලංකා සතොස ආයතනය දැනුවත් කර ඇත. | මුදල් අයකර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලක් විදුලිය වෙනුවෙන් එම ආයතනයෙන් මාස්පතා අය කරනු ලබයි. සමාලෝචිත වර්ෂය සඳහා එසේ කත්සේරු කරන ලද මුදලින් රු.2,157,813ක් තවදුරටත් අයවිය යුතුව පැවතිණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ එවකට සිටි වැඩ බලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල්ට ලන්ඩන් මහා කොමසාරිස් විසින් මුදල් ගණුදෙනුවක් සම්බන්ධ විද්‍යුත් තැපැල් පණිවිඩයක් පිළිබඳ චෝදනාවක් 2022 නොවැම්බර් 01 දින ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13 වගන්තිය අනුව මූලික විමර්ශනයක් පවත්වා නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති අතර මේ වන විට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/06/23/50/2023 හා 2023 මාර්තු 20 දිනැති ලිපියෙහි 03 ඡේදය අනුව ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/ පුහුණු/ සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මඟින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගි නොකළ යුතු බව දක්වා තිබුණ ද රු.1,453,925 ක් වැය කරමින් නිලධාරීන් තිදෙනකු 2023 මැයි මස 08 වන දින සිට 10 වන දින දක්වා අබුඩාබි නගරයේ පැවති වාර්ෂික ආයෝජන රැස්වීමකට සහභාගී කර තිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයේ 2023 මාර්තු 15 දිනැති PS/CSA/00/1/4/8 ලිපිය ප්‍රකාරව සංයුක්ත දීමනාව සහ අනියම් දීමනාව ලෙස රු. 1,453,925ක මුදල අත්තිකාරමක් ලෙස ලබා දී ඇත. | ලිපියේ විධිවිධාන අනුව කටයුතු කිරීම නිලධාරීන්ගේ වගකීම විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" සැසඳුම් ප්‍රකාශයෙහි දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය අතර රු.294,544 ක වෙනසක් වර්ෂ 17 කට අධික කාලයක සිට පැවතිණි. | 2005 වර්ෂයේ සිටම නොසැසඳෙන බව නිරීක්ෂණය වී ඇති බැවින් 2005 වර්ෂයේ සිට ගිණුම් නිවැරදි කිරීමට පියවර ගෙන ඇත . | පොත් අතර නොසැසඳීම නිරවුල් කිරීම කඩිනම් කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරු ඇතුළත්ව විශේෂ හා පළමු ශ්‍රේණියේ අනුමත තනතුරු 10න් තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් ලත් නිලධාරියෙකු නොසිටින බැවින් ඒ සඳහා නිලධාරියෙකු පත්කර නොමැත. සුදුසුකම් සපුරා ඇති වාණිජ අධ්‍යක්ෂවරු දෙදෙනා විදේශ රාජකාරියේ යෙදී සිටින බැවින් දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා වාර්තා කල පසු ඔවුන්ට එම තනතුරු හිමි වේ. | ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |